**චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය - 2015**

-----------------------------------------------------------------------------------------------------------

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතේ 11(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154**(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථා භාරයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවෙහි දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## **1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( **ISSAI 1000 – 1810** ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. **මූල්‍ය ප්‍රකාශන**
-----------------

2.1 **මතය**
-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-------------------------------------------

2.2.1 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**
-------------------------------------------------------------------------------

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ

| නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතෙහි 11 වගන්තිය 3 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සඳහා මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් මඟින් බලය දෙන ලද මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු අත්සන් කර ඉදිරිපත් කළ යුතු වුවද එසේ කර නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත 11 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.12,322,575 ක් වූ ආයෝජන සඳහා සමාලෝචිත වර්ෂයේදී හෝ පසුගිය වර්ෂවලදී භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**
---------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථා භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 705,128 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 370,784 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 334,344 ක එනම් සියයට 90 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. අනෙකුත් ආදායම් රු 348, 244 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්ය සාධනය**

(අ) චිත්‍රපට කලාකරුවන්ට හා කාර්මිකයන්ට දායක විශ්‍රාම වැටුප් ක්‍රම සකස් කිරීම, යහ අරමුදල්, ඉතිරි කිරීමේ අරමුදල්, ඉතිරි කිරීමේ හෝ සකසුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම පිහිටුවීම; විශ්‍රාම වැටුපක්, ණයක්, දීමනාවක්, නිවාස පහසුකමක් හෝ වෙනත් සමාන ප්‍රතිලාභයක් ඔහු වෙත පිරිනැමීම; කායික හෝ මානසික අබලතාවකට පත්ව සිය වෘත්තියෙහි යෙදීමට නොහැකිව සිටී නම්, යම් මුදල් ආධාරයක් පිරිනැමීම, අවමංගල්‍ය වියදම් වෙනුවෙන් මුදල් හෝ වෙනත් ආධාර පිරිනැමීම සංස්ථා භාරයේ ප්‍රධාන අරමුණ විය.

සමාලෝචිත වර්ෂයේ සංස්ථා භාරයේ ආදායම එහි ප්‍රධාන අරමුණු ඉටුකරගැනීමටවත් ප්‍රමාණවත් මට්ටමක නොතිබූ හෙයින් ඉදිරියේදී එහි අරමුණු ඉටුකරගැනීමේ දී ඒ සඳහා වන අරමුදල් සපයාගැනීමේ අවධානමක් පවතින බැවින් විකල්ප මූල්‍ය සම්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු විය යුතු බව නිරීක්ෂණය විය.

(ආ) 1998 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වර්ෂ 17 ක් තුළදී චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා විශ්‍රාම වැටුප්, වෛද්‍යාධාර හා මරණාධාර වශයෙන් එකතුව රු. 22,965,980 ක් ප්‍රදානය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් වශයෙන් රු. 1,438,000 ක්ද මරණාධාර රු. 40, 000 ක්ද වෛද්‍යාධාර වශයෙන් රු.10,000 ක් ද ගෙවා තිබුණි. එහෙත් 2015 දෙසැම්බර් 31 දින තෙක්ම චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ කටයුතු සඳහා භාරකාර මණ්ඩලයක් පත් නොකිරීම නිසා ප්‍රතිලාභීන් වෙනුවෙන් ඉතිරිකිරීමේ අරමුදල් පිහිටුවීම, සකසුරුවම් සමිති ඇති කිරීම, ණය ලබාදීම, නිවාස පහසුකම් ලබාදීම ආදී අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

**4.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1986 අංක 03 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයින් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතෙහි 3.1 සහ 3.2 ඡේද අනුව භාරයෙහි කළමනාකරණය සහ පාලනය සඳහා භාරකාර මණ්ඩලයක් පත්කළ යුතු වුවත් 2013 වර්ෂයේ සිට භාරකාර මණ්ඩලයක් පත්කර නොතිබුණි. ඒ හේතුවෙන් භාරයේ කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(i)** විශ්‍රාම ප්‍රතිලාභ ලබන කලාකරුවෙකු හෝ කාර්මිකයෙකු මියගිය විට ඉන් ඇතිවන පුරප්පාඩුව සඳහා පොරොත්තු ලේඛනයෙන් සුදුසුකම් ලබන විශ්‍රාමලාභියෙකු තෝරාගැනීම යාවත්කාලීනව සිදු නොවීම.

**(ii)** අරමුදලේ සාමාජිකයෙකු ජීවත්ව සිටීද යන්න පිළිබඳව නිසි තහවුරුකර ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව මාස්පතා විශ්‍රාම දීමනාව බැංකුගත කරනු ලබන බව නිරීක්ෂණය විය. තවද බැංකුගත නොකර මුදල් ලබා ගන්නා එක් විශ්‍රාම වැටුප් ලාභියෙකු රු.36,000 ක් වූ මාස 18 ක විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා ඉදිරිපත් වී නොතිබූ අතර අදාල මුදල් හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් වෙන්කිරීමේ ගිණුමකට බැරකර තිබුණි.එහෙත් මීට හේතු සොයාබලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මෙතෙක් සිදුකර නොතිබුණි.

**(iii)** භාරය මගින් ලබාදෙන ප්‍රතිලාභ පිළිබඳව කලාකරුවන් හා කාර්මිකයින් දැනුවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබීම නිසා නව ප්‍රතිලාභීන් අරමුදලට දායක කර ගැනීමට නොහැකි තත්ත්වයක් ඇතිවී තිබුණි.

(ආ) පනතෙහි 6 .2 (අ) අනුව සුදුසු ක්‍රම උපයෝගී කරගෙන අරමුදල් උපයා ගැනීමට හැකියාව තිබුණ ද එවැනි කිසිදු වැඩසටහනක් හෝ ක්‍රියාමාර්ගයක් ප්‍රවර්ථන වර්ෂය තුළදී ගෙන නොතිබුණි.

4.3 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2014 වර්ෂයේ ජනවාරි සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවීම් කිරීම සඳහා තෝරාගත් ආකාරය නිශ්චිතව සඳහන් නොමැති විශ්‍රාම වැටුප්ලාභී කලාකරුවන් 15 දෙනෙකුට එක් අයකුට මාසයකට රු.2000 බැගින් එකතුව රු. 720,000 ක් භාරකාර මණ්ඩලයේ අනුමැතිය රහිතව ගෙවා තිබුණි.

4.4 **කාර්ය මණ්ඩල පරිපාලනය**

පනතෙහි 6.2 (ඇ) වගන්තිය අනුව සංස්ථා භාරයෙහි කටයුතු වෙනුවෙන් වෙනම කාර්ය මණ්ඩලයක් පත්කිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබූ නමුත් එසේ කටයුතු නොකර භාරයේ රාජකාරී කටයුතු චිත්‍රපට සංස්ථාවේ කාර්ය මණ්ඩලය විසින්ම ඉටුකිරීම නිසා පනතේ අරමුණු ඉටුකර ගැනිමට නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණි.

5. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

5.1 **සංයුක්ත සැලැස්ම**

භාරය පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කරන ලද ස්වාධින ආයතනයක් වුවද 2015 වර්ෂය ඇතුළත් වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.2 **ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.3 **අභ්‍යන්තර විගණනය**

අරමුදල වෙනුවෙන් වෙනම අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබූ අතර 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (5) (ඇ) ඡේදයේ විධිවිධාන වලට අනුකූලව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර භාරයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) විශ්‍රාම වැටුප් ගෙවීම | විශ්‍රාම වැටුප් ලාභීන් ජීවත් වන බව හඳුනා ගැනීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයක් ඇතිකිරීම සහ පොරොත්තු ලේඛනය යාවත්කාලීන කිරීම. |
| (ආ) අරමුදල වර්ධනය කර ගැනීම | විශ්‍රාම වැටුප් ගෙවීම සහ වෛද්‍යාධාර ලබාදීමට ප්‍රමාණවත් වන පරිදි අරමුදල වර්ධනය කර ගැනීම. |